ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක: HRC/P/i/24/01/23

# මාධ්‍ය නිවේදනය

දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන විදුලි කප්පාදුව ඔස්සේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටින අපේක්ෂකයින්ගේ අධ්‍යාපන අයිතියට බාධාකාරි තත්වයක් ඇති වී ඇති බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට නිරීක්ෂණය වන බැවින්, අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය පැවැත්වෙන 2023 ජනවාරි මස 23 වන දින සිට 2023 පෙබරවාරි මස 17 දින දක්වා විදුලි විසන්ධි කිරීම වළක්වාලීමට අවශ්‍ය සුදුසු පියවර ගන්නා ලෙසට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත සහ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2023 ජනවාරි මස 23 දිනැතිව දන්වා යවා ඇත.

නමුත් ඒ පිළිබඳව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් කිසිදු පියවරක් ගෙන නොමැති බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරනු ලැබේ. ඒ අනුව ඒ පිළිබඳ විමසීම 2023 ජනවාරි මස 25 වන දින පෙ ව 10 30 ට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවැත්වෙන පරීක්ෂණය සඳහා සහභාගී වන ලෙස විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත සහ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත දන්වා යවා ඇත.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
2023.01.24